සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.21 / 0830 - 1030

ගෘහ ආර්ථික විද්‍යාව I
மனைப் பொருளியல் I
Home Economics I

28 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු **නොලැබේ**.
※ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

1. වර්ණ මගින් විවිධ හැඟීම් පිළිබිඹු කෙරෙයි. රතු වර්ණය මගින් පිළිබිඹු කෙරෙන හැඟීම් දෙකක් වන්නේ
(1) උණුසුම් බව සහ ක්‍රියාශීලි බව ය.
(2) පසුබසින ස්වභාවය සහ උණුසුම් බව ය.
(3) ඉදිරියට එන ස්වභාවය සහ කුඩා බව ය.
(4) ක්‍රියාශීලි බව සහ බර බව ය.
(5) පසුබසින ස්වභාවය සහ කුඩා බව ය.

2. කාමරයක වර්ණ යොදා ඇති ආකාරය පහත දැක්වේ.

සිවිලිම	-	සුදු	තිර රෙදි	-	දම් සහ ලා දුඹුරු
බිත්ති	-	ලාකොළ	ගෘහ භාණ්ඩ ආවරණ	-	ලා දම්
ගෙබිම	-	සුදු	මල් සැකසුම්	-	තද කොළ සහ තැඹිලි

මෙම කාමරය සඳහා භාවිත කර ඇති වර්ණ ගැළපුම
(1) බද්ධ වර්ණ ගැළපුමකි.
(2) අනුපූරක වර්ණ ගැළපුමකි.
(3) බෙදුනු අනුපූරක වර්ණ ගැළපුමකි.
(4) ද්විත්ව අනුපූරක වර්ණ ගැළපුමකි.
(5) ත්‍රිත්ව වර්ණ ගැළපුමකි.

3. නිවසක දක්නට ලැබුණු ලක්ෂණ දෙකක් පහත දැක්වේ.
- තරප්පු පෙළ
- සමචතුරස්‍රාකාර බිම් ගඩොල් (Floor tiles) අතුරා තිබීම

මෙම ලක්ෂණ දෙක මගින් රිද්මය පිළිබිඹු වන ආකාර දෙක වනුයේ පිළිවෙළින්,
(1) පුනරුක්තිය සහ ප්‍රතියෝගය ය.
(2) ප්‍රතියෝගය සහ සංක්‍රමණය ය.
(3) සංක්‍රමණය සහ ප්‍රතියෝගය ය.
(4) ප්‍රතියෝගය සහ පුනරුක්තිය ය.
(5) පුනරුක්තිය සහ සංක්‍රමණය ය.

4. ප්‍රජා සම්පත් පමණක් දැක්වෙන වරණය තෝරන්න.
(1) තැපැල් කාර්යාලය, ඉඩම් සහ නිවෙස්
(2) දුම්රිය ස්ථානය, පුස්තකාලය සහ ක්‍රීඩා පිටියනිය
(3) ඉඩම්, සිනමා ශාලාව සහ තැපැල් කාර්යාලය
(4) පුස්තකාලය, ගොඩනැගිලි සහ නිවෙස්
(5) ක්‍රීඩා පිටියනිය, දුම්රිය ස්ථානය සහ ගොඩනැගිලි

5. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් ජල බිල්පත හා සම්බන්ධ **සාවද්‍ය ප්‍රකාශය** කුමක් ද?
(1) පළමුවෙනි ඒකක 15 ලබාදෙන්නේ සහනදායි මිලකට ය.
(2) ජලය පරිභෝජනයේදී වැය වන ඒකක ප්‍රමාණය අනුව ගෙවිය යුතු මුදල තීරණය වේ.
(3) ජල ඒකකයක් සඳහා අය කිරීම විශේෂ සේවා අවශ්‍යතා මත වෙනස් වේ.
(4) සෑම බිලකටම ස්ථාවර මාසික ගාස්තුවක් අය කෙරේ.
(5) ජල බිල්පතක ඒකකයක් ලෙස සැලකෙනුයේ ජලය ලීටර 100 කි.

6. මූලික විදුලි සැපයුමෙන් ගෘහිය විද්‍යුත් පරිපථයට ලැබෙන විදුලිය සම්බන්ධ කිරීම හෝ විසන්ධි කිරීම [illegible] උපකරණය වනුයේ,
(1) පැන්නුම් වහරුව ය.
(2) විලායකය ය.
(3) [illegible]
(4) සේවා මීටරය ය.
(5) සිගිති පරිපථ බිඳිනය ය.

7. විදුලි කේතලයක ක්ෂමතාව 750 W වේ. එය පැය බාගයක් භාවිත කළ විට වැයවන විද්‍යුත් ශක්ති ප්‍රමාණය කිලෝවොට් පැය
(1) 0.375 කි. (2) 0.650 කි. (3) 0.750 කි. (4) 1.500 කි. (5) 1.650 කි.

8. අණුක සූත්‍රය $C_{12}H_{22}O_{11}$ වන කාබෝහයිඩ්‍රේටයක් වනුයේ,
(1) ඇමයිලෝස් ය. (2) සෙලියුලෝස් ය. (3) ග්ලූකෝස් ය. (4) ගැලැක්ටෝස් ය. (5) මෝල්ටෝස් ය.

9. සුක්‍රෝස් හඳුනාගැනීමේ රසායනික පරීක්ෂණයක් සඳහා අවශ්‍ය වන ප්‍රතිකාරක මොනවා ද?
(1) අයඩීන් සහ තනුක සල්ෆියුරික් අම්ලය
(2) අයඩීන් සහ පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ්
(3) තනුක සල්ෆියුරික් අම්ලය සහ ෆේලින්ග් A හා B ද්‍රාවණ
(4) පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ් සහ ෆේලින්ග් A හා B ද්‍රාවණ
(5) සාන්ද්‍ර නයිට්‍රික් අම්ලය සහ අයඩීන්

10. සිරුර තුළ ජල ද්‍රාව්‍ය තන්තුවල කාර්යයක් වනුයේ,
(1) ක්‍රමාකුංචනය වැඩි කිරීම ය.
(2) කොලෙස්ටරෝල් අවශෝෂණයට බාධා කිරීම ය.
(3) මල ද්‍රව්‍යවල පරිමාව වැඩි කිරීම ය.
(4) ආන්ත්‍රික ක්ෂුද්‍රජීවීන්ට මාධ්‍යයක් සැපයීම ය.
(5) මලබද්ධය වැළැක්වීම ය.

11. පහත සඳහන් ඇමයිනෝ අම්ල අතුරෙන් අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල දෙකක් වනුයේ,
(1) වැලීන් සහ සිස්ටයින් ය.
(2) මෙතියොනින් සහ ලයිසීන් ය.
(3) සිස්ටීන් සහ ත්‍රියොනින් ය.
(4) ටයිරොසීන් සහ ලියුසින් ය.
(5) ග්ලයිසීන් සහ අයිසොලියුසීන් ය.

12. සංයුක්ත ප්‍රෝටීන දෙකකි,
(1) හීමොග්ලොබින් සහ ලිපොප්‍රෝටීන.
(2) ෆොස්ෆොප්‍රෝටීන සහ පොලිපෙප්ටයිඩ.
(3) ලිපොප්‍රෝටීන සහ ඩයිපෙප්ටයිඩ.
(4) හීමොග්ලොබින් සහ පොලිපෙප්ටයිඩ.
(5) ෆොස්ෆොප්‍රෝටීන සහ ඩයිපෙප්ටයිඩ.

13. ඔමේගා 6 මේද අම්ල වනුයේ,
(1) ලිනොලෙනික් අම්ලය සහ ඇරකිඩොනික් අම්ලය ය.
(2) ඇරකිඩොනික් අම්ලය සහ ඔලීක් අම්ලය ය.
(3) ලිනොලෙනික් අම්ලය සහ ලිනොලෙයික් අම්ලය ය.
(4) ඔලීක් අම්ලය සහ ලිනොලෙයික් අම්ලය ය.
(5) ලිනොලෙයික් අම්ලය සහ ඇරකිඩොනික් අම්ලය ය.

14. ප්‍රතිඔක්සිකාරක දෙකක් වනුයේ,
(1) මැග්නීසියම් සහ විටමින් C ය.
(2) සෙලේනියම් සහ විටමින් D ය.
(3) මැග්නීසියම් සහ විටමින් A ය.
(4) සෙලේනියම් සහ විටමින් E ය.
(5) විටමින් E සහ විටමින් D ය.

15. අයඩීන් ඌනතාවෙහි රෝග ලක්ෂණයක් වනුයේ,
(1) හිසකෙස්වල පැහැය වෙනස් වීම ය.
(2) රුධිරය කැටි ගැසීම පමා වීම ය.
(3) කීලෝසියාව ය.
(4) වර්ධනය අඩාල වීම ය.
(5) ක්ලාන්ත ස්වභාවය ය.

16. සිරුරට අවශ්‍ය වන ක්ෂුද්‍ර පෝෂක හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ.
- අම්ල භෂ්ම තුලනය
- රුධිර පීඩනය
- වමනය සහ පාචනය
- කෙණ්ඩා පෙරළීම

ඉහත කරුණු කෙරෙහි බලපාන ක්ෂුද්‍ර පෝෂක දෙකක් වනුයේ,
(1) මැග්නීසියම් සහ සින්ක්
(2) යකඩ සහ කැල්සියම්
(3) සෝඩියම් සහ පොටෑසියම්
(4) තඹ සහ සෝඩියම්
(5) මැග්නීසියම් සහ පොටෑසියම්

17. නිරක්තියට හේතු **නොවන්නේ**,
(1) ෆෝලික් අම්ල ඌනතාවයි.
(2) විටමින් C ඌනතාවයි.
(3) විටමින් B_{12} ඌනතාවයි.
(4) තඹ ඌනතාවයි.
(5) ෆොස්ෆරස් ඌනතාවයි.

18. B කාණ්ඩයට අයත් විටමිනයක් වනුයේ,

(1) ඉනොසිටෝල් ය.
(2) රෙටිනෝල් ය.
(3) ටොකොෆෙරෝල් ය.
(4) කොලිකැල්සිෆෙරෝල් ය.
(5) නැෆ්තාක්විනෝන් ය.

19. පහත දැක්වෙන කුමන විටමින් ඌනතාව සෙරොෆ්තැල්මියාව හා කෙරටොමැලේෂියාව යන තත්ත්ව පිළිබිඹු කරයි ද?

(1) විටමින් A
(2) විටමින් B_1
(3) විටමින් B_2
(4) විටමින් C
(5) විටමින් D

20. නිර්දේශිත දෛනික පෝෂණ අවශ්‍යතා වගුව (2007) අනුව ප්‍රෝටීන අවශ්‍යතාව හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ළමා වියේදී එම අවශ්‍යතාව වෙනස් නොවේ.
(2) යොවුන් වියේදී පිරිමින්ගේ එම අවශ්‍යතාව ගැහැනුන්ට වඩා වැඩි ය.
(3) වැඩිහිටි අවධියේදී එම අවශ්‍යතාව ගැහැනු සහ පිරිමි දෙපාර්ශවයටම සමාන වේ.
(4) ගර්භිණී අවධියේ දෙවන හා තුන්වන ත්‍රෛමාසිකවලදී එම අවශ්‍යතාව සමාන වේ.
(5) ක්ෂීරණ අවධියේ පළමුවන වසර තුළදී එම අවශ්‍යතාව ක්‍රමයෙන් වැඩි වේ.

21. ග්ලූටන්, කොලැජන් හා ඕවොවිටලින් යන ප්‍රෝටීන අඩංගු ආහාර වනුයේ පිළිවෙලින්,

(1) බත්, මස් හා පීකුදු ය.
(2) තිරිඟු, මාළු හා කිරි ය.
(3) බත්, මස් හා බිත්තර ය.
(4) තිරිඟු, මාළු හා බිත්තර ය.
(5) ඉරිඟු, පීකුදු හා කිරි ය.

22. සංයුතියෙහි, විටමින් C සහ පෙක්ටින් බහුලව අඩංගු ආහාර ද්‍රව්‍යය වනුයේ,

(1) මුං ඇට ය.
(2) බෝංචි ය.
(3) දිවුල් ය.
(4) කොමඩු ය.
(5) ගෝවා ය.

23. ගැඹුරු තෙලේ බැදීම සඳහා වඩාත් සුදුසු තෙල් වර්ගය කුමක් ද?

(1) ඔලිව් තෙල්
(2) සෝයා තෙල්
(3) එළවදෑ තෙල්
(4) සූර්යකාන්ත තෙල්
(5) පොල් තෙල්

24. ආන්ත්‍රික යූෂයෙහි අඩංගු කාබොහයිඩ්රේට ජීරණ එන්සයිම දෙකක් වනුයේ,

(1) පෙප්ටිඩේස් සහ ලැක්ටේස් ය.
(2) මෝල්ටේස් සහ ලයිපේස් ය.
(3) සුක්‍රේස් සහ ලයිපේස් ය.
(4) පෙප්ටිඩේස් සහ මෝල්ටේස් ය.
(5) සුක්‍රේස් සහ ලැක්ටේස් ය.

25. පෝෂක අවශෝෂණය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) බොහෝ විට ක්ෂුද්‍රාන්ත්‍රයේ අපර කොටසේදී විටමින අවශෝෂණය සිදු වේ.
(2) ආහාරයේ ආම්ලිකතාව කැල්සියම් අවශෝෂණය වේගවත් කරයි.
(3) ඉන්සියුලින් හෝමෝනය, යකඩ අවශෝෂණයට බාධා කරයි.
(4) ආහාරයේ අඩංගු ජලය වැඩි ප්‍රතිශතයක් මහාන්ත්‍රයේදී අවශෝෂණය වේ.
(5) අංගුලිකා තුළදී මේද ද්‍රාව්‍ය විටමින රුධිර ධාරාවට අවශෝෂණය වේ.

26. පෝෂක පරිවෘත්තිය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ක්‍රෙබ් චක්‍රය තුළදී ශක්තිය, ජලය සහ ඔක්සිජන් නිපද වේ.
(2) ප්‍රෝටීන පරිවෘත්තියේදී කීටෝන් දේහ නිපද වේ.
(3) ග්ලයිකොලිසිය අවසානයේදී පයිරුවික් අම්ලය සෑදේ.
(4) මේද පරිවෘත්තියේදී යූරියා නිපද වේ.
(5) ප්‍රෝටීන පරිවෘත්තියේදී වකුගඩු තුළ ඇමයින්හරණය සිදු වේ.

27. ආහාර විෂවීම සිදු කරන බැක්ටීරියා විශේෂයක් වනුයේ,

(1) හෙලිකොබැක්ටර් පයිලෝරා (*Helicobacter pylora*)
(2) ලැක්ටොබැසිලස් ඇසිඩොෆිලස් (*Lactobacillus acidophillus*)
(3) ස්ට්‍රෙප්ටොකොකස් ලැක්ටිස් (*Streptococcus lactis*)
(4) ක්ලොස්ට්‍රිඩියම් බොටියුලිනම් (*Clostridium botulinum*)
(5) ඇසිටොබැක්ටර් ඇසිටයි (*Acetobacter aceti*)

28. පහත දැක්වෙන කුමන ආහාරය සඳහා පරිරක්ෂණ කාරකය ලෙස සෝඩියම් බෙන්සොඒට් භාවිත වේ ද?

(1) මාෂ්මෙලෝ
(2) වියලන ලද කරවල
(3) පුහුල් දෝසි
(4) අන්නාසි ජෑම්
(5) දුඹුරු දෙහි

29. ආහාර පරිරක්ෂණය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - කොස් වියළීමේදී විජලනය සිදු වේ.

B - පරිරක්ෂණ කාරකයක් වන සීනි, කාබනික සංයෝගයකි.

C - පොෆි සෑදීමේදී මිශ්‍රණයේ pH අගය අඩු වේ.

D - ජෑම් සෑදීමේදී මිශ්‍රණයේ සාන්ද්‍රණය වැඩි වේ.

මෙවායින් නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) *A* සහ *B* ය. (2) *B* සහ *C* ය. (3) *B* සහ *D* ය. (4) *A*, *B* සහ *C* ය. (5) *A*, *B* සහ *D* ය.

30. එනිල් මෘදුසාරය සෑදෙනුයේ පහත දැක්වෙන ආහාර අතුරෙන් කුමන ආහාරය සකස් කිරීමේ දී ද?

(1) පැන් කේක් (2) ඉක්ලෙයාර්ස් (3) බනිස් (4) පැටිස් (5) බටර් කේක්

31. ආහාර ද්‍රව්‍ය ඇසුරුම් කිරීම සඳහා භාවිත වන දෘඩ සහ අර්ධ දෘඩ ඇසුරුම් ද්‍රව්‍යවලට උදාහරණ දෙකක් වනුයේ පිළිවෙළින්,

(1) කාඩ්බෝඩ් සහ ඇලුමිනියම් පත්‍ර ය. (2) ලෝහ සහ ඇලුමිනියම් පත්‍ර ය.

(3) වීදුරු සහ ඝන ප්ලාස්ටික් ය. (4) ඝන ප්ලාස්ටික් සහ ලෝහ ය.

(5) කාඩ්බෝඩ් සහ වීදුරු ය.

32. ලැක්ටොබැසිලස් බල්ගරිකස් බැක්ටීරියාව අවශ්‍ය වනුයේ කුමන ආහාරය සකස් කිරීමේ දී ද?

(1) යෝගට් (2) චීස් (3) මුදවපු කිරි (4) ගිතෙල් (5) බටර්

33. ස්ටූ කිරීම පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?

(1) පිසීම සඳහා වැඩි කාලයක් අවශ්‍ය වීම ය.

(2) පෝෂක හානි වැඩි වීම ය.

(3) පිසීමේදී ආහාර ද්‍රව්‍ය කිහිපයක් මිශ්‍ර කරගත හැකි වීම ය.

(4) පියන වසා පිසීම කළ යුතු වීම ය.

(5) උකුබවක් ඇති කිරීම සඳහා ඉරිඟු පිටි (Corn flour) භාවිත කිරීම ය.

34. කේක් වර්ගයක් බේක් කළ පසු මැද බැස ඇති බව දිස් විය. මීට හේතුවිය හැකි වනුයේ,

(1) පිපුම්කාරක අඩුවෙන් යොදා තිබීම ය.

(2) බිත්තර වැඩිපුර යොදා තිබීම ය.

(3) අමුද්‍රව්‍ය හොඳින් මිශ්‍ර කර නොතිබීම ය.

(4) පෝරණුව නිතර ඇර බැලීම ය.

(5) පෝරණුවේ උෂ්ණත්වය වැඩිවීම ය.

35. යොවුන් වියෙහි පසුවන ගැහැනු දරුවකුගේ ස්ත්‍රී ප්‍රජනක හෝමෝන නිෂ්පාදනය කරනු ලබන්නේ,

(1) පිටියුටරි ග්‍රන්ථියෙනි. (2) අධිවෘක්ක ග්‍රන්ථිවලිනි.

(3) ඩිම්බකෝෂවලිනි. (4) ගර්භාෂයෙනි.

(5) ෆැලෝපීය නාලවලිනි.

36. ගර්භිණී කාලසීමාව සාමාන්‍යයෙන්,

(1) දින 250 කි. (2) දින 260 කි. (3) දින 270 කි. (4) දින 280 කි. (5) දින 300 කි.

37. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් ගර්භිණී අවධිය හා සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?

(1) උදෑසන ඔක්කාරය හා වමනය පැවතිය හැකි ය.

(2) මව්කිරි නිෂ්පාදනය ආරම්භ වේ.

(3) පාදවල ඉදිමීම් දැකිය හැකි ය.

(4) දියවැඩියාවෙන් පෙළීම් අවදානම් සාධකයකි.

(5) වැඩිම බර වැඩිවීම පෙන්නුම් කෙරෙනුයේ දෙවන ත්‍රෛමාසිකය තුළ ය.

38. ජීවන චක්‍රය තුළ ශීඝ්‍ර කායික හා චාලක වර්ධනයක් දැකිය හැකි අවධි දෙකකි,

(1) ළදරුවිය සහ මුල් ළමාවිය. (2) මුල් ළමාවිය සහ පසු ළමාවිය.

(3) පසු ළමාවිය සහ යොවුන්විය. (4) ළදරුවිය සහ යොවුන්විය.

(5) මුල් ළමාවිය සහ යොවුන්විය.

39. ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන (2007) අනුව, පංච සංයුජ එන්නතෙහි 4 වන මාත්‍රාව දරුවාට දෙනු ලබන්නේ කුමන වයස සම්පූර්ණ වූ විට ද?

(1) මාස 6 (2) මාස 9 (3) මාස 12 (4) මාස 18 (5) අවුරුදු 3

40. පසු ළමාවිය දරුවකු තුළ දැකිය හැකි ලක්ෂණයකි,
(1) රූපු ඇඳියාව. (2) සංකල්ප සාධනය උපරිම වැඩිවීම.
(3) ගැටලු විසඳීමෙහි නිරතවීම. (4) භාවික තීව්‍ර ලෙස පිළිබිඹු කිරීම.
(5) දවල් හීන මැවීම.

41. පහත දැක්වෙන රෝග අතුරෙන්, පසු ළමාවිය දරුවකුට දෙනු ලබන එන්නත මගින් වළක්වන රෝගය කුමක් ද?
(1) කම්මුල්ගාය (2) සරම්ප (3) පෝලියෝ (4) රුබෙල්ලා (5) කක්කල් කැස්ස

42. පහත දැක්වෙන චර්යා අතුරෙන්, යොවුන් වියෙහිදී උපදේශනය අවශ්‍ය වන චර්යාව කුමක් ද?
(1) කැපී පෙනීමට කැමැත්ත දැක්වීම
(2) කලහකාරී චර්යා පෙන්නුම් කිරීම
(3) ස්වාධීනව තීරණ ගැනීමට උත්සාහ කිරීම
(4) දෙමව්පියන් සමඟ තර්ක කිරීම
(5) වැඩිහිටි මැදිහත්වීම නුරුස්සන බව පෙන්වීම

43.



A



B

ඉහත **A** සහ **B** රූපසටහන්වලින් පිළිවෙළින් දැක්වෙනුයේ,
(1) දිගකොට මැස්ම සහ කේබල් මැස්ම ය.
(2) ජර්මනගැට මැස්ම සහ රුමේනියන් මැස්ම ය.
(3) රුමේනියන් මැස්ම සහ දිගකොට මැස්ම ය.
(4) ජර්මන්ගැට මැස්ම සහ කේබල් මැස්ම ය.
(5) කේබල් මැස්ම සහ දිගකොට මැස්ම ය.

44. පහත දැක්වෙන වැකි අතුරෙන් නිවැරදි වැකිය කුමක් ද?
(1) රෙදි පිරියම් කිරීමේදී, රෙද්ද ජලයෙහි පොගවා, හොඳින් තෙරපීම කර වියළා ගනියි.
(2) තනුක අම්ලවලින් ලෝම කෙඳිවලට හානි සිදු නොවේ.
(3) නිරි වියමන භාවිත කර වියනු ලබන රෙදි ශක්තිමත් බවින් අඩු ය.
(4) එම්බ්‍රොයිඩර් කිරීමේදී, රෙදි මතුපිට මෝස්තර පිටපත් කර මැසීමෙන් මනා නිමාවක් ලබාගත හැකි ය.
(5) උතුරන ජලයේ බහා තැබීමෙන් සේද රෙදි පිරිසිදු කර ගත හැකි වේ.

45. රෙදි නිෂ්පාදනය සඳහා භාවිත වන කෙඳි වර්ගවල ගුණාංග කිහිපයක් පහත දැක්වේ.
A - බර ගැන්වීම කළ හැකි ය.
B - ගින්නට ඇල්ලූ විට උණු වේ.
C - ඇඳෙනසුලු බව වැඩි ය.
D - කෙඳි තුළ වාතය රඳවා තබා ගත හැකි ය.
E - සේදුම් කාරකවල ඇති ක්ෂාර මගින් හානි සිදු නොවේ.
ඉහත කරුණු අතුරෙන් නයිලෝන් කෙඳිවල ගුණාංග වනුයේ,
(1) *A*, *B* සහ *C* ය. (2) *A*, *D* සහ *E* ය. (3) *B*, *C* සහ *D* ය. (4) *B*, *C* සහ *E* ය. (5) *C*, *D* සහ *E* ය.

46. බොත්තම්කාසයක කැපුම් අද්දර සහ සාජු අද්දර නිමකිරීම සඳහා යොදාගන්නා මැස්ම පිළිවෙළින්,
(1) කතිර මැස්ම සහ හුරුළුකටු මැස්ම වේ.
(2) බ්ලැන්කට් මැස්ම සහ බොත්තම්කාස මැස්ම වේ.
(3) හුරුළුකටු මැස්ම සහ කතිර මැස්ම වේ.
(4) බොත්තම්කාස මැස්ම සහ බ්ලැන්කට් මැස්ම වේ.
(5) හුරුළුකටු මැස්ම සහ බ්ලැන්කට් මැස්ම වේ.

47. පහත දැක්වෙන රූපසටහන් අතුරෙන් කැපීම සඳහා සාරි හැට්ට පතරොම් කොටස් නිවැරදිව අතුරා ඇති ආකාරය දැක්වෙන්නේ කුමකින් ද?


(1)


(2)


(3)


(4)


(5)

48. පහත දැක්වෙන්නේ සිසු සටහනකින් උපුටාගත් වැකි කිහිපයකි.

A - දක්කු රේඛා ලෙස හැඳින්වෙනුයේ මූලික පතරොම මත තැබිය යුතු සලකුණු විශේෂයකි.
B - රටහුනු සහ පුයර, පැල්ලම්හරණය සඳහා භාවිත කරන අවශෝෂක වේ.
C - කමෙදහි මූලික පතරොම නිර්මාණය කිරීම සඳහා ලැම මිනුම ගණනය කිරීමේදී ලිහිල් වශයෙන් සෙන්ටිමීටර පහක් එකතු කළ යුතු ය.
D - 12% කෝස්ටික් සෝඩා ද්‍රාවණයක කපු රෙදි ගිල්වා තැබීමේදී, රෙදිවල වයනය වෙනස් වේ.
E - මේස ඇතිරිල්ලක වකු අද්දර නිම කිරීම සඳහා කෙලින් පටියක් අල්ලා එය සම්පූර්ණයෙන් නොපිට හරවා මැසීම කළ යුතු ය.

මෙම වැකි අතුරෙන් නිවැරදි වනුයේ,

(1) *A*, *B* සහ *D* ය. (2) *A*, *C* සහ *E* ය. (3) *B*, *C* සහ *D* ය. (4) *B*, *D* සහ *E* ය. (5) *C*, *D* සහ *E* ය.

49. රෙදිපිළි තාක්ෂණය හා සම්බන්ධව සිසුවකු විසින් ලියන ලද වැකි කිහිපයක් පහත දැක්වේ. මෙවා අතුරෙන් **සාවද්‍ය** වනුයේ කුමක් ද?

(1) ගෘහපිළිවල අද්දර අලංකාර කිරීම සඳහා අත් සැරසිලි යොදා ගනියි.
(2) 'සැන්ෆරීකරණයට භාජනය කරන ලදී' යනුවෙන් සඳහන් වී ඇති රෙදි සේදීමේදී 1% කට වඩා හැකිලීමක් සිදු නොවේ.
(3) රෙදි සේදීම සඳහා භාවිත නොවෙන සබන්වල TFM ප්‍රතිශතය අඩු ය.
(4) රෙදිවල ඇති කුණු ඇලී ඉවත් කිරීමට යොදන කාරක, පෘෂ්ඨීය ක්‍රියාකාරී කාරක නම් වේ.
(5) ගෘහීය රෙදිපිළි පවිත්‍ර කරගැනීම සඳහා සබන් මිශ්‍ර ජලයේ දිගු වේලාවක් බහා තැබීම යෝග්‍ය වේ.

50. රෙදි දළ කිරීම පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) රෙදිපිළි සුදු පැහැ ගන්වන අතර අවශෝෂකතාව වැඩි කරයි.
(2) ශක්තිමත් බවක් සහ ඔතුවිට යටයක් ලබාදෙයි.
(3) රෙදිවල ඇති පැල්ලම් සියල්ල ඉවත් වේ.
(4) කෙඳිවලට ආලේපයක් ලෙස ක්‍රියාකරමින් ස්ථිති විද්‍යුතය අඩු කරයි.
(5) ඕනෑම රෙදි වර්ගයක් සඳහා යෝග්‍ය වේ.

* * *

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ගෘහ ආර්ථික විද්‍යාව II
மனைப் பொருளியல் II
Home Economics II

28 S II

2018.08.24 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:

※ **I** කොටසින් **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **තුනකට** ද **II** කොටසින් **පස්වන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **හතරකට** ද පිළිතුරු සපයන්න.

I කොටස

(**පළමුවන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **දෙකක්** ද ඇතුළු ව ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.)

1. රැකියාවල නියුතු, නගරබදව විසීමට අදහස් කරන නව යුවලක්, ඒ සඳහා නිදන කාමර දෙකකින් සමන්විත ගෘහයක් තෝරාගෙන ඇත. නව අත්දැකීමක් වුව ද ගෘහීය සම්පත් කළමනාකරණය සහ ගෘහ අලංකරණය කෙරෙහි ද ඔවුහු සැලකිලිමත් වෙති.

(i) ගෘහය තෝරාගැනීමේදී ඔවුන් විසින් සලකා බලන ලද කරුණු **හතරක්** ලියන්න.

(ii) නිවසේ අය වැය ලේඛනය සකස් කරගැනීම සඳහා ඔවුන්ට දිය හැකි උපදෙස් **හතරක්** ඉදිරිපත් කරන්න.

(iii) විද්‍යුත් ශක්තිය තාප ශක්තිය බවට හා විද්‍යුත් ශක්තිය යාන්ත්‍රික ශක්තිය බවට පරිවර්තනය කිරීම මගින් ක්‍රියා කරන උපකරණ කිහිපයක් ඔවුන් සතුව ඇත.

 (*a*) එවැනි උපකරණ **එක** බැගින් පිළිවෙළින් නම් කරන්න.

 (*b*) නිවසෙහි විදුලිය අරපිරිමැස්ම සඳහා ඔවුන්ට ගත හැකි ක්‍රියාමාර්ග සඳහන් කරන්න.

(iv) ඔවුන්ගේ විසිත්ත කාමර පුටු කට්ටලය මත කුෂන් තබා ඇත.

 (*a*) විවිධ වර්ණයෙන් යුතු රිබන්, රේන්දු සහ සීක්වින්ස් භාවිතයෙන් කුෂන් කවර විසිතුරු කරගැනීම සඳහා සුදුසු මෝස්තරයක් අඳින්න.

 (*b*) ඉහත ද්‍රව්‍ය එම මෝස්තරය තුළ යොදාගන්නා අයුරු වර්ණ සංයෝජනය ද සමග දක්වන්න.

2. (i) සටහන් ලියන්න.

 (*a*) ෆෙල්ට් කිරීම

 (*b*) ගැටපඬු ක්‍රමය

(ii) පිරිමි කමිසයක් මසා නිම කරන අනුපිළිවෙළ ලියන්න.

(iii) ඇඳුමක් ඇඟලා බැලීමේදී එහි මනා හැඩය කෙරෙහි බලපාන කරුණු පැහැදිලි කරන්න.

(iv) විස්කෝස් රේයෝන් කෙඳිවල නිෂ්පාදන ක්‍රියාවලිය විස්තර කරන්න.

3. (i) ගෘහ කළමනාකරණ ක්‍රියාවලිය පියවර හතරකින් යුක්ත ය. එම පියවර නම් කර, ඉන් එක් පියවරක් පැහැදිලි කරන්න.

(ii) නිවසක් ගොඩනැගීම සඳහා සැලසුම් කිරීමේදී සලකා බැලිය යුතු කරුණු **පහක්** ඉදිරිපත් කරන්න.

(iii) (*a*) ගෘහ අලංකරණයේදී වැදගත් වන පහත දැක්වෙන සාධක දෙක හඳුන්වන්න.

- ස්වාභාවිකත්වය
- ක්‍රියානුරූපී බව

 (*b*) ඉහත (iii) (*a*) හි සඳහන් එක් සාධකයක් පිළිබිඹු වන සේ ගෘහයක විවෘත ආලින්දය සකස් කර ගත හැකි අයුරු පැහැදිලි කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

4. (i) (*a*) උදාසීන වර්ණ නම් කරන්න.

(*b*) නිවෙස් අලංකරණයේදී මෙම වර්ණ භාවිත කළ හැකි ආකාරය උදාහරණ **තුනක්** මගින් ඉදිරිපත් කරන්න.

(ii) මෘදු වයනයක් පිලිබිඹු වන සේ විසිත්ත කාමරයක් අලංකාර කර ගත හැකි අයුරු පැහැදිලි කරන්න.

(iii) ඇඳුම් සඳහා

- පෝරුව යෙදීම
- පයිපින් කිරීම

පහදන්න.

(iv) සාරි හැට්ටයක කර හැඩයෙහි මනා නිමාවක් ලබාගැනීම සඳහා, මැසීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සඳහන් කරන්න.

II කොටස

(**පස්වන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **තුනක්** ද ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.)

5. පවුලක් මවුපියන්ගෙන්, මුල් ළමාවිය දියණියකගෙන් සහ පසු ළමාවිය පුතකුගෙන් සමන්විත වේ. මවුපියෝ රැකියාවල නිරත වෙති. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයකට යන දියණිය දෙමවුපියන් පැමිණෙන තෙක් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක සිටින්නී ය. ඇයගේ ආහාර වේල් ද එමගින් සපයනු ලැබේ. අසල්වැසි ඥාති කාන්තාවක් පුතා සමග දිවා කාලයේ රැඳී සිටින්නී ය.

(i) මෙම පවුල සඳහා සතියේ දිනක දිවා ආහාර වේලක් සැලසුම් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **පහක්** සඳහන් කරන්න.

(ii) දියණියගේ පෝෂණ මට්ටමෙහි දුර්වලතා ඇති බව මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයෙහි සිදු කළ වෛද්‍ය පරීක්ෂණයකින් අනාවරණය විය. එම තත්ත්වය දරුවා තුළින් පිලිබිඹු වන ලක්ෂණ **හතරක්** ඉදිරිපත් කරන්න.

(iii) පවුලේ පරිභෝජනය සඳහා සමහර අවස්ථාවල නිවසේදී, නැවුම් පලතුරුවලින් කෝඩියල් පිළියෙල කරනු ලැබේ. කෝඩියල් වර්ගයක් පිළියෙල කිරීමේ අනුපිළිවෙළ ගැලීම් සටහනක් මගින් දක්වන්න.

(iv) පසු ළමාවිය දරුවාගේ භාෂා වර්ධනය උදෙසා දෙමවුපියන්ට ගත හැකි පියවර සාකච්ඡා කරන්න.

(v) දිවා සුරැකුම් මධ්‍යස්ථානයක කාර්යභාරය විමසන්න.

6. (i) ගර්භිණී මවකට ඇයගේ දිනචර්යාව පිළිබඳ ව උපදෙස් දීමේදී වැදගත් වන කරුණු සඳහන් කරන්න.

(ii) මුල් ළමාවිය දරුවන්ගේ සංවර්ධනය කෙරෙහි 'සෙල්ලම් ගෙය' දායක වන අයුරු පැහැදිලි කරන්න.

(iii) පසු ළමාවියෙහි සමහර දරුවන් පිලිබිඹු කරන අසාමාන්‍ය චර්යාවකි 'හුදෙකලා බව'. මෙම තත්ත්වය ඇති වීමට හේතු දක්වා, ඉන් මුදවා ගැනීමට ගත හැකි පියවර යෝජනා කරන්න.

(iv) ප්‍රජාතාන්ත්‍රික පරිසරය යොවුන් දරුවන්ගේ සංවර්ධනය කෙරෙහි වැදගත් වන අයුරු සාකච්ඡා කරන්න.

7. (i) වෙළඳපොළට ඉදිරිපත් කිරීම සඳහා සකස් කර, ඇසුරුම් කළ ආහාරයක ලේබලයේ අඩංගු විය යුතු කරුණු සඳහන් කරන්න.

(ii) ආහාරවල සුරක්ෂිතතාව සඳහා සැලකිලිමත් විය යුතු කරුණු **පහක්** ඉදිරිපත් කරන්න.

(iii) 'බීජ ප්‍රරෝහණය' සහ 'ප්‍රෝටීන් පරිපූරණය' යන ක්‍රියාවලි දෙක මගින් ආහාරවල ගුණාත්මක බව වැඩිදියුණු කළ හැකි ය. මෙම ක්‍රියාවලි මගින් ආහාරයේ ගුණාත්මක බව වැඩි වන අයුරු පැහැදිලි කරන්න.

(iv) කෙටි කෑම වර්ග (short eats) පරිභෝජනය වර්තමානයේ ජනප්‍රිය වී ඇත. එම ආහාර මගින් ප්‍රජාවගේ පෝෂණ තත්ත්වය කෙරෙහි ඇති වන බලපෑම විමසන්න.

8. (i) මහා පෝෂක හඳුන්වා, ඉන් **එක්** පෝෂකයක කෘත්‍ය **හතරක්** සඳහන් කරන්න.

(ii) ක්ෂීරණ මව්වරුන් සඳහා යකඩ අවශ්‍යතාවට ඉහළ අගයක් නිර්දේශ කර ඇත. මීට හේතු දක්වන්න.

(iii) සංසන්දනය කරන්න.

(*a*) පිෂ්ටය සහ ග්ලයිකොජන්

(*b*) කිරි පැස්ටරීකරණය සහ ජීවානුහරණය

(iv) දියවැඩියා රෝගයෙහි සංකූලතා පැහැදිලි කරන්න.

[තුන්වැනි පිටුව බලන්න.

9. (i) ඔබේ පාසලේ පැවැත්වීමට සැලසුම් කර ඇති 'සෞඛ්‍යවත් ජීවිතය සහ පෝෂණය' පිළිබඳ සායනයට සහභාගිවන්නන්ගේ ශරීර ස්කන්ධ දර්ශකය මැනීම සහ අදාළ උපදෙස් ලබාදීම ඔබට පැවරී ඇත.

(*a*) 'ශරීර ස්කන්ධ දර්ශකය' හඳුන්වන්න.

(*b*) ශරීර ස්කන්ධ දර්ශක අගය සාමාන්‍ය මට්ටමට වඩා වැඩි වීමේ තත්ත්ව දෙකකි. මෙම තත්ත්ව දෙක අදාළ ශරීර ස්කන්ධ දර්ශකයෙහි පරාස සමඟ දක්වන්න.

(*c*) මෙම තත්ත්වවල පසුපන්නන්ට සෞඛ්‍යවත් ජීවිතයක් සඳහා ලබාදිය යුතු උපදෙස් පැහැදිලි කරන්න.

(ii) පහත සඳහන් දෑ සාකච්ඡා කරන්න.

(*a*) දරුවන්ගේ චාලක වර්ධනය හා කායික වර්ධනය අතර සම්බන්ධතාවක් ඇත.

(*b*) දරුවන්ගේ සංවර්ධනය සඳහා සමවයස් කණ්ඩායම් ඇසුර වැදගත් වේ.

* * *